# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## මුදල් චක්‍රලේඛ ලිපි අංක : 9/2015

**2015/12/30**

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්,
ආයතන අධ්‍යක්ෂවරුන්,
මණ්ඩපාධිපතිවරුන්,

<u>විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් සඳහා යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය</u>

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් සඳහා යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයට අදාලව නිකුත් කරන ලද 2015.07.09 දිනැති මුදල් චක්‍රලේඛ ලිපි අංක 01/2015 වෙත ඔබගේ අවධානය යොමු කෙරේ.

01. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කල අතිරේක ප්‍රතිලාභ සලකා බැලීමෙන් පසු, යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ඇමුණුම 01 හි පරිදි සංශෝධනය කිරීම 2015.12.03 දින පැවති සභා වාරයේදී අනුමත කරන ලදී.

02. සුදුසුකම්

    විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වල ස්ථිර සේවකයෝ මෙම යෝජිත රක්ෂණ ආවරණ ක්‍රම 01 හෝ 02 සඳහා සුදුසුකම් ලබති.

(03) යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය 2016.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

(04) සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා වූ නව අයදුම්කරුවන්ගේ ලේඛනය විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන විසින් 2016/02/15 දින හෝ එදිනට ප්‍රථම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත භාරදිය යුතුය.

(05) වාරික ගෙවීම

සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් සඳහා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ආවරණ ක්‍රමය 02-b අනුව තනි පුද්ගලයෙක් සඳහා වන වාරිකයෙන් 50% ක සමාන ප්‍රමාණයක් (රු. 14,492/- x 50%) වාර්ෂික අයවැයෙන් වෙන්කල යුතුය. මෙම රක්ෂණ ක්‍රමය සඳහා සුදුසුකම් ලත් සේවකයන්ට තමන්ගේ මනාපය පරිදි ඇමුණුම 1 හි දැක්වෙන රක්ෂණාවරණයක් තෝරා ගත හැකි අතර (ආවරණ ක්‍රම 01 ඒ/බී - පවුල් ඒකකය/තනි පුද්ගලයන් සඳහා <u>හෝ</u> ආවරණ ක්‍රම 02 ඒ/බී-පවුල් ඒකකය/ තනි පුද්ගලයෙක් සඳහා) ඒ සඳහා වන අතිරේක පිරිවැය (අතිරේක පිරිවැය = තෝරාගත් රක්ෂණාවරණයක් පිරිවැය - විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වලින් දරන මුදල) සේවකයා විසින් දැරිය යුතුය.

රක්ෂණ ගිවිසුමෙහි මුල් මාස තුන ඇතුලතදී මුළු වාර්ෂික වාරික මුදල විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ප්‍රේෂණය කල යුතු අතර ගිවිසුම් කාලය ඇතුලත සේවකයින්ගේ දායක මුදල ඔවුන්ගේ වැටුපෙන් අඩුකර ගත යුතුය.

තවද, වාර්ෂික රක්‍ෂණ මුදල ඇතුලත් සේවකයින්ගේ ලේඛන මෙම චක්‍රලේඛයේ පෝරම 1 – A හා 1 – B ට අනුකූල විය යුතුය.

(06) අදාල විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් සෞඛ්‍ය රක්ෂණය සඳහා වන සියලු ක්‍රියාකාරී කටයුතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ සෘජුවම සම්බන්ධීකරණය කල යුතු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවශ්‍ය වූ අවස්ථාවකදී පමණක් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරී කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වේ.

ඉහත සඳහන් සංශෝධන සහිතව මුදල් චක්‍රලේඛ 2015/01 ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වේ.

මේ පිළිබඳ වැඩිමනක් තොරතුරු දැනගැනීම සඳහා 0112-685 511 දුරකථන අංකය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරි ඇමතිය හැකිය.

මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ වි.ප්‍ර.කො.ස.
3. උප සභාපති/වි.ප්‍ර.කො.ස.
4. කොමිෂන් සාමාජිකයන්/වි.ප්‍ර.කො.ස.
5. ලේකම්/වි.ප්‍ර.කො.ස.
6. සියළුම පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී/වි.ප්‍ර.කො.ස.
9. විශ්වවිද්‍යාලවල මූල්‍යාධිකාරීවරුන්
10. ආයතනවල/මණ්ඩපවල පුස්ථකාලාධිපති /ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර පුස්ථකාලාධිපතිවරුන්
11. ආයතනවල/මණ්ඩපවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර ලේඛකාධිකාරීවරුන්
12. ආයතනවල/මණ්ඩපවල නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක/ වි.ප්‍ර.කො.ස.
14. වෘත්තීය සමිති ලේකම්වරුන්
15. වෘත්තීය සමිති නියෝජිතයන්
16. විගණකාධිපති

<u>යෝජිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ</u> රු.

| වාර්ෂික නේවාසික ප්‍රතිලාභ | ආවරණ ක්‍රමය 01 | | ආවරණ ක්‍රමය 02 | |
|---|---|---|---|---|
| | ආවරණ ක්‍රමය 01 a | ආවරණ ක්‍රමය 01 b | ආවරණ ක්‍රමය 02 - a | ආවරණ ක්‍රමය 02- b |
| එක් අවස්ථාවක් සඳහා උපරිමය (එක් වර්ෂයක් සඳහා උපරිමය) | 400,000 | 400,000 | 200,000 | 200,000 |
| | | | | |
| 01) රෝහල් හා සාත්තු නිවාස නඩත්තු ගාස්තු | 160,000 | 160,000 | 80,000 | 80,000 |
| දිනකට කාමර ගාස්තුව උපරිමයකට යටත්ව | 8,500 | 8,500 | 7,500 | 7,500 |
| 02) උපදේශක විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත ලබා දෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල් සහ ආරෝග්‍යශාලා හා සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වෛද්‍ය හා ශල්‍යකර්ම වියදම් හා ශල්‍යාගාර ගාස්තු, ශල්‍යකර්ම හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු, පිළිගත් වෛද්‍යවරයකුගේ නිර්දේශ මත හෝ ආරෝග්‍යශාලාවක සාත්තු නිවාස නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේ දී වෛද්‍ය උපදේශක සේවා හෝ විශේෂඥ වෛද්‍ය ගාස්තු, සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා යන මේවා ඇතුලු විශේෂඥ සේවා | 240,000 | 240,000 | 120,000 | 120,000 |
| අමතර ආවරණය (පුද්ගලික රෝහල්) | | | | |
| 01) සාමාන්‍ය දරු උපතක් සඳහා උපරිමය | 160,000 | 160,000 | 80,000 | 80,000 |
| 02) ශල්‍යකර්ම මඟින් දරු උපත් ආවරණය | 200,000 | 200,000 | 150,000 | 150,000 |
| 03) අඬු භාවිතය (Forceps) / පීඩන (Vacuum) දරු උපත් ආවරණය | 200,000 | 200,000 | 150,000 | 150,000 |
| | | | | |
| නේවාසික ප්‍රතිකාර (රජයේ රෝහල්) | | | | |
| 01) රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක නේවාසික ප්‍රතිකාර ලබා ඇත්නම් (දිනකට) උපරිම දින 30 දක්වා ප්‍රතිපූර්ණය කරනු ලැබේ. | 3,500 | 3,500 | 2,000 | 2,000 |
| 02) රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබන විට පිටතින් ලබා ගන්නා බෙහෙත් පරීක්ෂණ, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා විදුලිමය ප්‍රතිකාර | 100,000 | 100,000 | 75,000 | 75,000 |
| | | | | |
| අනෙකුත් ආවරණය | | | | |
| 01) නිවුන් දරු උපත් ආවරණය | 25,000 | 25,000 | 10,000 | 10,000 |
| 02) ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය ආවරණය වන අතර ඒ සඳහා (Cataract) යොදාගනු ලබන කාච සඳහා (උපරිම සීමාව) | 30,000 | 30,000 | 30,000 | 30,000 |
| | | | | |
| පුද්ගල හදිසි අනතුරු ආවරණය ( සේවකයාට පමණි) | | | | |
| 01) හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන මරණයකදී | 500,000 | 500,000 | 500,000 | 500,000 |
| 02) ස්වාභාවික මරණයක දී | 100,000 | 100,000 | 100,000 | 100,000 |
| | | | | |
| බදු සහ පරිපාලන ගාස්තු රහිත වාර්ෂික වාර මුදල | | | | |
| තනි පුද්ගලයෙක් සඳහා | 17,500 | 22,000 | 8,250 | 12,750 |
| පවුල් ඒකකයක් සඳහා | 20,750 | 25,250 | 9,650 | 14,150 |

| | | | | |
|---|---|---|---|---|
| බාහිර ප්‍රතිකාර ගාස්තු | | | | |
| ඖෂධ සඳහා වන ගාස්තු **(විටමින් වර්ග හැර),** වෛද්‍ය හා විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය උපදේශක සේවා ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | - | 6,000 | - | 6,000 |
| | | | | |
| බදු සහ පරිපාලන ගාස්තු සහිත වාර්ෂික වාර මුදල | | | | |
| තනි පුද්ගලයෙක් සඳහා | 19,891 | 25,006 | 9,377 | 14,492 |
| පවුල් ඒකකයක් සඳහා | 23,585 | 28,700 | 10,968 | 16,083 |
| | | | | |
| අසාධ්‍ය රෝග ආවරණය **(සේවකයාට පමණි / අසාධ්‍ය රෝග 24)** | | | | |
| වර්ෂයක දී එක් පුද්ගලයකුට එක් අවස්ථාවකදී උපරිමය **(සේවකයාට පමණි)** | 800,000 | 800,000 | 600,000 | 600,000 |
| එක් වර්ෂයක් සඳහා උපරිමය | 24,000,000 | 24,000,000 | 18,000,000 | 18,000,000 |
| එක් වර්ෂයක් සඳහා උපරිම අවස්ථා ගණන | උපරිමයක් නොමැත. | | | |

සැ. යු. රක්ෂණ ගිවිසුම ආරම්භ වන දිනයේදී පවතින රජයේ බදු ප්‍රමාණයන් මෙයට අදාල වේ.

පෝරමය 01 - ඒ

# විශ්වවිද්‍යාල සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය- සාමාජිකයන් ගේ තොරතුරු

විශ්වවිද්‍යාලය /උසස් අධ්‍යාපන ආයතනය : ......................................................................................

සාමාජික ලැයිස්තුව

| සාමාජිකයාගේ තොරතුරු | | | | යැපෙන්නන්ගේ තොරතුරු | | | | සමූහ ජීවිත රක්ෂණාවරනය |
|---|---|---|---|---|---|---|---|---|
| සාමාජිකයාගේ නම | උපන් දිනය | සේවක අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | යැපෙන්නන්ගේ නම් | උපන් දිනය | බැංකු ගිණුම් අංකය | වාරිකය (රු) | වාරිකය (රු) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

.........................................................
නි.ලේ. /ජේ.ස.ලේ. /ස.ලේ. අත්සන
(ආයතන අංශය)

.............................
ලේකම්/ලේඛකාධිකාරීගේ අත්සන

නිවැරදිව සම්පූර්ණ කරන ලද මෙම පොරමයේ දෘඩ පිටපත සහ මෘදු පිටපත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත සෘජුවම යොමු කල යුතුය.

පෝරමය 01 - බී

# විශ්වවිද්‍යාල සඳහා වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය

විශ්වවිද්‍යාලය /උසස් අධ්‍යාපන ආයතනය : ...............................................................................................

රක්ෂණ වාරික මුදල

| සාමාජිකයාගේ තොරතුරු | | | රක්ෂණ වාරික මුදල (රු.) | | | | සමූහ ජීවිත රක්ෂණ වාරිකය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| සාමාජිකයාගේ නම | සේවක අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | ආවරණ ක්‍රමය 1 | | ආවරණ ක්‍රමය 2 | | | |
| | | | a | b | a | b | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

චෙක්පත් අංකය:- .........................

චෙක්පත් දිනය :- .........................

වටිනාකම (රු.):- .........................

..................................
මූල්‍යාධිකාරීගේ අත්සන

**සටහන:**
වාර්ෂික වාරික මුදලට සමාන වටිනාකමකින් යුතු "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව" නමින් ලියූ චෙක්පත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මෙම පෝරමයේ ඈඩ පිටපත සහ මෘදු පිටපත සෘජුවම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යොමු කල යුතුය.

පෝරමය 02

රක්ෂණ ආවරණ ක්‍රමය I [ ]

II [ ]

| සේවක අංකය |
|---|
| |

## විශ්වවිද්‍යාල සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය - 2016
## අයදුම් පත්‍රය

**උසස් අධ්‍යාපන ආයතනයේ / උසස් අධ්‍යයන විද්‍යායතනය :**

......................................................................................................................................

1) මුලකුරු සමඟ සාමාජිකයාගේ නම : ..............................................................................................
2) දැනට දරන තනතුර: ...................................................................................................................
3) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් අංකය: .......................................................................................
4) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය ලැබූ දිනය:..............................................................
5) උපන් දිනය:..............................................................................................................................
6) ජාතික හැඳුනුම්පත් අංකය:.........................................................................................................
7) පුද්ගලික ලිපිනය:.......................................................................................................................
8) විවාහක/ අවිවාහක බව:...............................................................................................................
9) පවුල් ඒකක සඳහා වන සාමාජික තොරතුරු :

i) කලත්‍රයාගේ නම (විවාහ වී ඇත්නම්) — උපන් දිනය — ජා.හැ. අංකය

.................................................................. ...................... .................

ii. වයස අවුරුදු 0-21 දක්වා අවිවාහක දරුවන් ගේ විස්තර:

| දරුවන්ගේ නම් | උපන් දිනය | ජා.හැ. අංකය |
|---|---|---|
| .................................................................. | ...................... | ................. |
| .................................................................. | ...................... | ................. |
| .................................................................. | ...................... | ................. |
| .................................................................. | ...................... | ................. |

10) බැංකු ගිණුම් අංක: බැංකු වේ නම ..................... බැංකු සංකේත අංකය- ......... ශාඛා සංකේත අංකය- ...............ගිණුම් අංකය- .......................................
11) ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවද සහතික කර සිටිමි.
12) සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අදාල වාර්ෂික මුදල වන රු. ....................................... ක් මාගේ වැටුපෙන් අයකර ගැනීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

.............................................

අයදුම්කරුගේ අත්සන

*<u>සටහන :</u> මෙම අයදුම්පත්‍රය අදාල උසස් අධ්‍යාපන ආයතනයේ / උසස් අධ්‍යයන විද්‍යායතනයේ ප්‍රයෝජනය සඳහා පමණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවීමට අවශ්‍ය නැත.*